සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved

NEW

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2022**
**ආදර්ශ ප්‍රශ්න පත්‍රය**
**General certificate of Education (Adv. Level) Examination 2022**
**Model Paper**

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 Minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

*උපදෙස් :*

* *'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.*
* *ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.*

**'අ' උප කොටස**
**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

**1)**

**I.** අවශ්‍යතා සහ උවමනා යන සංකල්ප උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 03)

**II.** හිඟකම, තේරීම, ආවස්ථික පිරිවැය යන සංකල්ප අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 04)

**III.** නිෂ්පාදන සාධක ලෙස යොදාගන්නා ශ්‍රමය සහ ව්‍යවසායකත්වය අතර වෙනස දක්වන්න. (ලකුණු 03)

**IV.** බඩඉරිඟු සහ රෙදි පමණක් නිපදවන සරල ආර්ථිකයක සියලුම සම්පත් බඩඉරිඟු නිෂ්පාදනයට යෙදවුයේ නම්, බඩඉරිඟු බුසල් මිලියන 15 නිපදවයි. රෙදි නිෂ්පාදන ඒකක මිලියනය බැගින් වැඩි කිරීමේදී බඩඉරිඟු නිෂ්පාදනය පිළිවෙළින් බුසල් මිලියන 3, 5 සහ 7 වශයෙන් අඩු කළ යුතුව ඇත. (ලකුණු 06)

**a)** ඉහත දත්ත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් ඉදිරිපත් කරන්න.
**b)** බඩඉරිඟු බුසල් 7ක් රෙදි ඒකක මිලියන 2ක් නිෂ්පාදනය කරමින් සිටී නම් , එම තත්ත්වය A මගින් නිෂ්පාදන හැකියා වක්‍රයක ලකුණු කරන්න.
**c)** බඩඉරිඟු බුසල් මිලියන 12ක් සහ රෙදි ඒකක මිලියන 1.5ක් නිෂ්පාදන සංයෝගය B ලෙස ලකුණු කරන්න.
**d)** A සිට B දක්වා නිෂ්පාදන හැකියාව වැඩිකර ගත හැක්කේ කෙසේද?
**e)** A සිට B දක්වා පරිභෝජන මට්ටම වැඩිකර ගත හැක්කේ කෙසේද?
**f)** මෙම රටට රෙදි නිෂ්පාදනය සඳහා අවශ්‍ය සියලුම බනිජතෙල් ආනයනය කරන්නේ යැයි සිතන්න. බනිජතෙල් මිල ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා රෙදි කර්මාන්තශාලා කිහිපයක් වසා දමා ඇත. මෙම තත්ත්වය නිෂ්පාදන හැකියා වක්‍රයේ පෙන්නුම් කරන්න.

**V.** මූලික ආර්ථික ප්‍රශ්න මිල යාන්ත්‍රණය යොදාගනිමින් විසඳන ආකාරය පැහැදිලි කරන්න . (ලකුණු 04)

**2)**

**I.** පහත සිදුවීම් මගින් තේ සඳහා ඇති වෙළඳපොළ සැපයුම් වක්‍රයට සිදුවන බලපෑම හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 03)

- **a)** වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් ඉහළ යාම.
- **b)** කෝපි මිල ඉහළ යාම නිසා තේ වගාබිම් විශාල සංඛ්‍යාවක් කෝපි වගාවට යොදා ගැනීම.
- **c)** රජය තේ වගාව සඳහා පොහොර සහනාධාර ලබාදීම.

**II.** භාණ්ඩයක ඉල්ලුමේ මිල නම්‍යතාවය, පහතට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක තැනින් තැන වෙනස් වන්නේ ඇයි? (ලකුණු 04)

**III.** යම් නිශ්චිත කාලච්ඡේදයක් තුළ අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල හා එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් (ඉල්ලුම් නීතිය) ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු දෙකක් නම් කර, "ඉල්ලුම් නීතිය" පැහැදිලි කරනුයේ කෙසේ දැයි උදාහරණ මගින් පහදන්න. (ලකුණු 04)

**IV.** සැපයුමේ මිල නම්‍යතාවය තීරණය කෙරෙන සාධක හතරක් නම් කරන්න. (ලකුණු 04)

**V.** එක්තරා වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ. (ලකුණු 05)

$$Qd = 500 - 5P$$
$$Qs = -100 + 5P$$

- **a)** වෙළඳපොළ සමතුලිතය ප්‍රස්ථාරයක් ඇසුරෙන් දක්වන්න.

රජය විසින් මෙම භාණ්ඩය වෙළෙඳපොළේ අලෙවි කළ හැකි උපරිම මිල රුපියල් 40 ලෙස නියම කරන ලදී. ඒ අනුව පහත ගණනය කිරීම් සිදුකරන්න.

- **b)** අධි ඉල්ලුම කොපමණ ද?
- **c)** කළු කඩ මිල පරාසය කොපමණද ?
- **d)** පාරිභෝගික අතිරික්තයේ වෙනස්වීම කොපමණද?
- **e)** ආර්ථික සුභසාධනයේ වෙනස්වීම කොපමණද?

**3)**

**I.** නිෂ්පාදන ආයතනයක පිරිවැය කෙරෙහි "හීනවන ඵල න්‍යාය" හා "පරිමානුකූල ඵල න්‍යාය" බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

**II.** "ගණකාධිකරණ පිරිවැය" හා "ආර්ථික පිරිවැය" යන සංකල්ප එකිනෙක වෙනස් වන්නේ මන්දැයි පහදන්න. (ලකුණු 04)

**III.** "පූර්ණ තරඟකාරී ආයතනයක් තිරස් ඉල්ලුම් වක්‍රයකට මුහුණ දුන්න ද, කර්මාන්තය පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දේ. "මෙහි සත්‍යතාව විග්‍රහ කරන්න. (ලකුණු 04)

**IV.** වෙළෙඳපොළක "පිවිසුම බාධාකාරී" වීම යනු කුමක්ද? (ලකුණු 02)

**V.** යම් දෙන ලද ආයතනයක් කෙටි කාලයේ දී මිලගනුවෙකු යැයි සිතන්න. ඒ අනුව

- නිමවුම = ඒකක 40
- වෙළඳපොළ මිල = රු. 100/-
- නිමවුම් ඒකක 40 දී සාමාන්‍ය මුළු පිරිවැය රු.120/- කි.
- සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු.80/- කි.

- **a)** කෙටි කාලයේදී ආයතනයේ ලාභය / අලාභය ? (ලකුණු 03)
- **b)** ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය ? (ලකුණු 03)

Sabaragamuwa University of Sri Lanka

4)

I. “සමතුලිත ජාතික ආදායම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටමට අවශ්‍යයෙන්ම සමාන නොවේ.” මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 03)

II. “රජයක් ඉතුරුම්වලට ජනතාව පෙළඹවූවත් එමඟින් පරිභෝජනය සීමා වී සමාහාර ඉල්ලුම දුර්වල වී ආර්ථිකය සංකෝචනය වේ. ඒ නිසා ඉතුරුම් දිරිගැන්වීම නුසුදුසුයි.”ඔබ එකඟ වන්නේ ද? (ලකුණු 03)

III. කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් 2020 වර්ෂයට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත. (ලකුණු 06)

**( සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි )**

| | |
|---|---|
| සේවක ගෙවීම් | 3300 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 800 |
| නිෂ්පාදනය මත අනෙකුත් (ශුද්ධ) බදු | 150 |
| විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම් | 180 |
| විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් | 470 |
| භාණ්ඩ හා සේවා මත (ශුද්ධ) බදු | 500 |
| කුටුම්භ අංශයේ අවසන් පරිභෝජනය | 8000 |
| රාජ්‍ය අංශයේ අවසන් පරිභෝජනය | 1000 |
| ගෙවුම් තුලනයේ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය | 1200 |
| ආයෝජනය | 3700 |
| ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 150 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 6000 |
| මිශ්‍ර ආදායම | 750 |

පහත දෑ ගණනය කරන්න.

a) මූලික මිලට සමස්ත එකතු කළ අගය
b) වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය
c) දළ ජාතික ආදායම
d) වැය කළ හැකි දළ ජාතික ආදායම
e) ජාතික ඉතුරුම්
f) 2020 වර්ෂයේ විදේශ ශුද්ධ ණයදීම් / විදේශ ශුද්ධ ණය ගැනීම්

IV.

| | |
|---|---|
| S | -500 + 0.2Yd |
| J (විදීම්) | 380 |
| Yd | 3900 |
| විභව නිමැවුම | 4500 |

පහත දෑ ගණනය කරන්න. (ලකුණු 05)

a) සමතුලිත නිමැවුම
b) ස්වාධීන වියදම් ගුණකය
c) බදු
d) අවධමන පරතරය
e) සමස්ථ ඉල්ලුම (Ad) වැඩි වීම නිසා සමතුලිත නිමැවුම විභව නිමැවුම කරා යෑමට, මුළු විදීම් කොපමණ විය යුතුද ?

V. දළ දේශීය වියදමත්, දළ ජාතික නිෂ්පාදනයත් වෙනසක් පැවතුනහොත් එරට ගෙවුම් ශේෂය පිළිඹිබු වන්නේ කෙසේද ? (ලකුණු 03)

5)

Sabaragamuwa University of Sri Lanka

**I.** තුලිත අයවැය ගුණකය යනු කුමක්ද ? තුලිත අයවැය ගුණකයේ අගය 1ට සමාන වන්නේ ඇයි? **(ලකුණු 03)**

**II.** කල්පිත ආර්ථිකයක් සඳහා අදාළ වන සාර්ව ආර්ථික තොරතුරු පහත පරිදි වේ. **(ලකුණු 09)**

**(සියලු ම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි)**

- පෞද්ගලික පාරිභෝජන(C ) = 250 + 0.75 Yd
- ආයෝජනය ( I ) = 250
- රජයේ මිලදී ගැනීම් (G ) = 300
- ශුද්ධ අපනයන (NX ) = - 200
- ආනයන (M) = 300
- බදු (T ) = 200
- වැය කළ හැකි ආදායම (Yd) = (Y – T)

**a)** මෙම ආර්ථිකයේ ස්වායත්ත වියදම්වල එකතුව කොපමණද?
**b)** මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය කුමක්ද?
**c)** සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න.
**d)** මෙම ආර්ථිකයේ පාරිභෝජනය නොවෙනස්ව පවතිද්දී රාජ්‍ය වියදම් බිලියන 50කින් ද, ස්ථාවර බදු රුපියල් බිලියන 75කින් ද, වැඩිවුණි නම් ආර්ථිකයේ ගුණක බලපෑම කොපමණද?

**III.** රුපියල් මිලියන් 100කින් බදු ඉහළ දැමීම නිසා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවන පහළ යාමට වඩා විශාල පහළ යාමක් රුපියල් මිලියන 100කින් ආණ්ඩුවේ මිලදී ගැනීම් අඩු වූ විට හටගනී. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද ? පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

**IV.** කිසියම් ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 6000, වැයකළ හැකි පෞද්ගලික ආදායම් රුපියල් මිලියන 5400, වෙළඳ ගිණුමේ හිඟය රුපියල් මිලියන 200ක් , පරිභෝජන වියදම රුපියල් මිලියන 4200 , අයවැය හිඟය රුපියල් මිලියන 100ක් හා අපනයන රුපියල් මිලියන 50ක් යැයි සලකන්න. **(ලකුණු 05)**

**a)** ඉතුරුම් ගණනය කරන්න.
**b)** ආණ්ඩුවේ මිල දී ගැනීම් කොපමණ ද?
**c)** ආයෝජන මට්ටම කොපමණ ද?

**'ආ' උප කොටස**
**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

Sabaragamuwa University of Sri Lanka

**6)**

**I.**

**a)** " බැංකු පද්ධතියක පවතින තනි වාණිජ බැංකුවකට මුදල් මැවිය නොහැක" ඔබ මෙම ප්‍රකාශනය සමඟ එකඟ වන්නේ ද ? එකඟ නොවන්නේ ද ? හේතු දක්වන්න. **(ලකුණු 02)**

**b)** ණය ශ්‍රේණිගත කිරීම යනු පුද්ගලයකුට ආයතනයකට හෝ රටකට ණය ලබා ගැනීමට ඇති යෝග්‍යතාවය තක්සේරු කිරීම වේ. ණය ශ්‍රේණිගත කිරීම වැදගත් වන්නේ ඇයි ? **(ලකුණු 02)**

**II.** සමාහාර වියදමේ සංරචක හඳුනාගෙන ආර්ථිකයක සමාහාර වියදම් ඉහළ යාමක් නිසා උද්ධමනයක් හටගත හැක්කේ කෙසේද යන්න ප්‍රස්තාර සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

**III.** කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම් රුපියල් මිලියන 7900ක් වූ අතර ඉන් රුපියල් 3200ක් මහජනයා සතු ව්‍යවහාර මුදල් වේ. බැංකු සතු සංචිත රුපියල් මිලියන 470කි.

**a)** තැන්පතු ප්‍රසාරණ ගුණකය හා බැංකුව ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය ගණනය කරන්න. **(ලකුණු 03)**

**b)** මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය නොවෙනස්ව තිබියදී මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% දක්වා ඉහළ නැංවුවහොත් "a" කොටසේ අගයන් හා මුදල් සැපයුම ගණනය කරන්න. **(ලකුණු 02)**

**IV.** පොලී අනුපාත ඉහළ යන විට පුද්ගලයන් මුදල් ශේෂ අඩුවෙන් ඉල්ලුම් කරයි ද ? වැඩියෙන් ඉල්ලුම් කරයි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

**V.** වර්තමානයේ ශ්‍රී ලංකාව ඉතා ඉහළ උද්ධමනයකට මුහුණ දෙමින් සිටින අතර ආර්ථික විචල්‍යයන් හිතකර මෙන්ම අහිතකර ප්‍රතිවිපාක භුක්ති විඳිමින් සිටියි. පොදුවේ ගත් කළ උද්ධමනකාරී තත්ත්වයක දී ඇතිවන අහිතකර ප්‍රතිවිපාක මොනවාද? **(ලකුණු 04)**

7)

**I.** ශුද්ධ පොදු භාණ්ඩ පොදු සම්පත්වලින් වෙනස් වන්නේ කෙසේ ද? උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

**II.** "මිල යාන්ත්‍රණයේ ඌනතා දුරලනු වස් නූතන ආණ්ඩු වෙළෙඳපොළ අර්ථක්‍රමය තුළ බහුවිධ කාර්යභාරයක් ඉටු කරයි." පහදන්න. **(ලකුණු 04)**

**III.** ශ්‍රී ලංකාවේ ඉදිවෙමින් පවතින පෝර්ට් සිටි (Port City) ව්‍යාපෘතිය තුළින් පෞද්ගලික පිරිවැයට වඩා අඩු සමාජ පිරිවැයක් ඇතිකරන බව ආර්ථික විද්‍යාඥයින් පවසයි.මෙහි ඇති බාහිරතාවය හඳුනාගනිමින් අදාළ ප්‍රස්තාර සටහන් ද උපයෝගී කරගනිමින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

**IV.** පුනරාවර්තන වියදම් යනු මොනවාද? පුනරාවර්තන වියදම් ඉහළ මට්ටමක පැවතීමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද? **(ලකුණු 04)**

**V.** වර්තමාන ආර්ථිකය තුළ පවතින අර්බුදකාරී තත්ත්වය හමුවේ ආදායම් ව්‍යාප්ති විෂමතා අධික ලෙස පුළුල් වී ඇත. එම තත්ත්වය අවම කර ගැනීම සඳහා රජය විසින් පිස්කල් ප්‍රතිපත්තිය යොදා ගනී. පිස්කල් ප්‍රතිපත්තිය හඳුන්වා ආදායම් විෂමතාවය අවම කර ගැනීමට පිස්කල් ප්‍රතිපත්තිය යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

8)

**I.** ඉන්දියාව සහ ජපානය යන රටවල් දෙක පරිගණක සහ මෝටර් රථ නිෂ්පාදනයේ යෙදේ. දෙන ලද යෙදවුම් භාවිතයෙන් රටවල් දෙක විසින් එක් එක් භාණ්ඩයෙන් නිපදවන ප්‍රමාණ පිළිබඳ කල්පිත දත්ත පහත වගුවේ දැක්වේ.

| රට | පරිගණක | මෝටර් රථ |
|---|---|---|
| ජපානය | 50 | 150 |
| ඉන්දියාව | 10 | 50 |

ඉහත තොරතුරුවලට අනුව රටවල් දෙක විදේශ වෙළඳාම සඳහා විශේෂීකරණය විය යුතු ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

**II.** සාපේක්ෂ වාසි හටගන්නා මූලාශ්‍ර මොනවාද? **(ලකුණු 04)**

**III.** තීරුබදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග දක්වන්න. **(ලකුණු 04)**

**IV.** ලෝක වෙළඳ සංවිධානයේ අරමුණු හා කාර්යයන් මොනවාද? **(ලකුණු 04)**

**V.** වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළත් වී ඇති ද්වි පාර්ශ්වීය හා බහු පාර්ශ්වීය ගිවිසුම්වලට නිදසුන් දක්වන්න.

**(ලකුණු 03)**

Sabaragamuwa University of Sri Lanka

**9)**

**I.**

**a)** රටක ආර්ථික වෘද්ධිය සීමා කරන සාධක මොනවාද?

**b)** ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය තුළ ආර්ථික ව්‍යුහයේ ඇතිවිය හැකි වාසිදායක හා අවාසිදායක තත්ත්වයන් මොනවාද? **(ලකුණු 04)**

**II.** නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාව අතර වෙනස පෙන්වාදෙන්න. **(ලකුණු 04)**

**III.** ශ්‍රී ලංකාවේ මුහුණ පා ඇති උද්ධමනකාරී වතාවරණය හමුවේ දිනෙන් දින ඉහළ යන ආහාර මිල සමග ඇතැම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා හිඟවීමේ අවදානමක් ඇත. වර්තමානයේ හටගෙන ඇති ආර්ථික අර්බුද හමුවේ ශ්‍රී ලංකාව ආහාර අර්බුදයකට මුහුණ දෙමින් සිටී. මේ සඳහා බලපා ඇති හේතු උදාහරණ දක්වා පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

**IV.** ජනගහනය වියපත් වීම යන්නෙන් කුමක් අදහස් වේ ද? ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත්වීමේ ප්‍රවණතාව හා අභියෝග කවරේ ද? **(ලකුණු 06)**

**10)**

**I.** 1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය එහි ප්‍රධාන ලක්ෂණ සහිතව පහදන්න. **(ලකුණු 05)**

**II.** විදේශ සේවා නියුක්තිය හා විදේශ සේවා ප්‍රේෂණ ලැබීම ආර්ථිකය මත ඇති කරන බලපෑම වර්තමාන ශ්‍රී ලංකා ආර්ථික අවපාතය ඇසුරෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

**III.** ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කඩා වැටීමට ප්‍රධාන හේතු සාධක පෙන්වා දෙමින් එහි ඇති වැදගත්කම සහ පවත්නා වර්තමාන අභියෝග සාකච්ඡා කරන්න. **(ලකුණු 05)**

**IV.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින ආර්ථිකමය අර්බුදය නැවත යතා තත්වයට පත්කිරීම සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා උදාහරණ දෙමින් පහදන්න **(ලකුණු 05)**

Sabaragamuwa University of Sri Lanka